කැලණිය විශ්වවිද්‍යාලය - සමාජීය විද්‍යා පීඨය

ශාස්ත්‍රපති/සමාජීය විද්‍යාපති පාඨමාලාව - 2020

වාර්ෂික පරීක්ෂණය (2021 ඔක්තෝබර් - දෙසැම්බර්)

ආර්ථික විද්‍යාව

**ECON 53015/ ECON M 01 : උසස් ආර්ථික න්‍යාය - සූක්ෂ්ම ආර්ථික විද්‍යාව**

**ප්‍රශ්න හතරකට (04) පමණක් පිළිතුරු සපයන්න.**

ප්‍රශ්න සංඛ්‍යාව: 06 යි. කාලය: පැය 03 යි.

---

01. (i) උපයෝගීතා ශ්‍රිතය $= U(x,y) = x^{0.25}\ y^{0.75}$

අයවැය සංරෝධකය $= XPx + YPy = M$

X සහ Y භාණ්ඩ දෙකක් වන අතර, Px යනු X භාණ්ඩයේ මිල ද Py යනු Y භාණ්ඩයේ මිල සහ M යනු පාරිභෝගික ආදායම වෙයි. මෙම තොරතුරු භාවිත කර,

(අ) මාර්ෂලියානු ඉල්ලුම් වක්‍ර ව්‍යුත්පන්න කරන්න. (ලකුණු 05)

(ආ) ඉහත (අ) ප්‍රතිඵල භාවිත කර හානිපූරණ ඉල්ලුම් ශ්‍රිත ව්‍යුත්පන්න කරන්න. (ලකුණු 05)

(ඇ) X නමැති භාණ්ඩයේ මිල අඩුවීමේ මුළු ප්‍රතිවිපාකය ආදායම් සහ ආදේශන ප්‍රතිවිපාක වශයෙන් හික්ෂියානු හෝ ස්ලට්ස්කියානු ක්‍රමය වෙන් කරන අයුරු රූප සටහන් මගින් පැහැදිලි කරන්න. (ලකුණු 05)

02. (අ) නිෂ්පාදන ක්‍රියාවලි විග්‍රහයේදී විකල්ප ප්‍රවේශයන්ට වඩා නිෂ්පාදන ශ්‍රිත ප්‍රවේශය ප්‍රචලිතව යොදා ගන්නේ ඇයි දැයි පැහැදිලි කරන්න. (ලකුණු 04)

(ආ) දිගුකාලීන නිෂ්පාදන ක්‍රියාවලිය හා සම්බන්ධ පරිමානානුකූල ඵල පැහැදිලි කර, විවිධ ස්වරූපයේ පරිමානානුකූල ඵල ඇතිවීමට හේතු විස්තර කරන්න. (ලකුණු 07)

(ඇ) නිෂ්පාදනයේ තාක්ෂණික ප්‍රගතිය යන්නෙන් ඔබ අදහස් කරන්නේ කුමක් ද? නිමැවුම් මට්ටම සහ යෙදවුම් සංයෝගය කෙරෙහි එය බලපාන්නේ කෙසේ දැයි සැකෙවින් දක්වන්න. (ලකුණු 04)

03. (අ) "බහු-නිෂ්පාදිත ආයතනයක් තීරණය කළ යුත්තේ ප්‍රශස්ත සාධක සංයෝගය නොව ප්‍රශස්ත නිමැවුම් සංයෝගයයි." සාකච්ඡා කරන්න. (ලකුණු 04)

(ආ) නිෂ්පාදන සම්පත් G ප්‍රමාණයක් යොදා ගනිමින් X හා Y යන භාණ්ඩ දෙක පමණක් නිපදවන ආයතනයක සමතුලිතය ප්‍රස්තාරිකව හෝ ගණිතමය සමීකරණ භාවිතයෙන් විස්තර කරන්න. (ලකුණු 07)

(ඇ) ප්‍රසාරණ පථය අර්ථ දක්වන්න. නිෂ්පාදකයින්ට එය වැදගත් වන්නේ කෙසේ ද?

(ලකුණු 04)

04. (අ) අර්ථ ක්‍රමයක සුබසාධක ආර්ථික ප්‍රතිපත්ති පිළිබඳ ආර්ථික විද්‍යාඥයන් අතර බොහෝවිට එකඟතාවය නොපවතින්නේ මන් ද? පහදන්න. (ලකුණු 07)

(ආ) අර්ථ ක්‍රමයක සමාජ සුබසාධක ප්‍රතිපත්තිවල ප්‍රධාන අරමුණු මොනවාදැයි පැහැදිලි කරන්න. (ලකුණු 08)

05. (අ) තොරතුරු අසමමිතිකතාවයන් පවත්නා විට අලෙවිකරුවන් හා ගැනුම්කරුවන්ට මිල පිළිබඳව එකඟතාවයකට පැමිණීමට දුෂ්කර වන්නේ මන් ද? උදාහරණ සමඟින් පැහැදිලි කරන්න.

(ආ) සදාචාර හානිය (moral hazard) සහ එය වෙළෙඳපොළ කාර්යක්ෂමතාවන්ට බලපෑම් කරනු ලබන්නේ කෙසේ ද යන්න පැහැදිලි කරන්න.

(ඉ) ශ්‍රම වෙළෙඳපොළවල තොරතුරු අසමමිතිකතාවයන් පවතින්නේ මන් ද? නව සේවක සොයාගැනීමේ දී සේවා යෝජකයන් සොයනු ලබන සංඥා කවරේ ද?

(ඊ) තොරතුරු අසමමිතිකතාව ප්‍රමුඛ - අනුගාමික සම්බන්ධතා කෙරෙහි බලපෑම් කළ හැක්කේ කෙසේදැයි පැහැදිලි කරන්න.

06. සිරකරුවන්ගේ උභතෝකෝටික වැනි ක්‍රීඩාවක පහත දැක්වෙන ලැබුම් න්‍යාසය (payoff matrix) සලකන්න. (සියලු අගයන් රුපියල් මිලියනවලිනි.)

**පළමුවන ක්‍රීඩකයා**

| දෙවන ක්‍රීඩකයා | සහයෝගීව ක්‍රියාකරයි | | වංචා කරයි | |
|---|---|---|---|---|
| සහයෝගීව ක්‍රියාකරයි | 10 | 10 | 0 | 12 |
| වංචා කරයි | 12 | 0 | 5 | 5 |

(අ) එක් එක් ක්‍රීඩකයන්ගේ ආධිපත්‍යධාරී උපක්‍රමය (dominant strategy) කුමක් ද? ක්‍රීඩාවේ නැෂ් සමතුලිතය කුමක්දැයි පැහැදිලි කරන්න. මෙම ක්‍රීඩාවේ පැරටෝ කාර්යක්ෂම සමතුලිතය කුමක් ද?

(ආ) ද්විඅධිකාරී වෙළෙඳපොළක ක්‍රියාත්මක වන ආයතන දෙකක් $Q_1$ හෝ $Q_2$ ප්‍රමාණවලින් භාණ්ඩයක් අලෙවි කිරීමට සැලසුම් කරනු ලබන අතර පහත දැක්වෙන න්‍යාසය මගින් ආයතන දෙකෙහි ලැබුම් න්‍යාසය (payoff matrix) නිරූපණය වේ.

**දෙවන ආයතනය**

| පළමුවන ආයතනය | $Q_1$ | | $Q_2$ | |
|---|---|---|---|---|
| $Q_1$ | 30 | 30 | 50 | 35 |
| $Q_2$ | 40 | 60 | 20 | 30 |

(i) ආයතන දෙක සමගාමීව එහිදී තීරණ ගනු ලබන්නේ නම් නැෂ් සමතුලිතය කුමක් ද? එහිදී එක් එක් ආයතනය විසින් භාවිතා කරනු ලබන්නේ කවර උපක්‍රමය ද?

(ii) පළමුවන ආයතනය ප්‍රථමයෙන් තීරණය ගනු ලබන්නේ යැයි සලකන්න. එවිට ප්‍රතිඵලය කුමක් ද?

(iii) දෙවන ආයතනය ප්‍රථමයෙන් තීරණය ගනු ලබන්නේ යැයි සලකන්න. එවිට ප්‍රතිඵලය කුමක් ද?

(iv) නැෂ් සමතුලිතය සහ පැරටෝ කාර්යක්ෂම සමතුලිතය අතර පවතින වෙනස පැහැදිලි කරන්න.

## Faculty of Social Sciences - University of Kelaniya

### MA/MSSc Course - 2020

### Year End Examination (October – December 2021)

### Economics

### ECON 53015/ M 01 : Advanced Economic Theory Microeconomics

**Answer only Four (04) questions.**

**No. of Questions: 06** **Time : 03 hours**

---

01. (i) Utility function = $U(x,y) = x^{0.25}\ y^{0.75}$

Budget constraint = $XPx + YPy = M$

X and Y are two goods. Px is the price of X, Py is the price of Y and M is the consumer income. Derive following by using above data.

(a) Derive the Marshallian demand functions. (05 Marks)

(b) Derive the compensated demand functions using the results of (a) (10 Marks)

(c ) Explain how decompose the total effect of price reduction of good X into income and substitution effect under Hickshian or Slutsky approach by using graphs. (05 Marks)

02. (i) Describe, why production function analysis is widely used than alternative approaches in analyzing the production processes. (04 Marks)

(ii) Explain returns to scale in the long-run production process and describe the reasons behind this different type of returns to scale. (07 Marks)

(iii) What do you mean by technological progress in production? Briefly explain, how it is affected on the level of output and input combination. (04 Marks)

03. (i) A multi -product firm must decide the optimum product combination but not the optimum factor combination." Discuss. (04 Marks)

(ii) Describe the equilibrium of a multi-product firm graphically or mathematically assuming that the firm products X and Y, using G amount of resources.
(07 Marks)

(iii) Define the expansion path. How is it useful for producers? (04 Marks)

04. (i) Why do economists often disagree on welfare policies in an economy? Explain.
(07 Marks)

(ii) Explain what are the major goals of social welfare policies in an economy.
(08 Marks)

05. (i) Why might it be difficult for a buyer and seller to agree on a price when asymmetric information exists? Explain with examples

(ii) Explain moral hazard and how it can effect the efficiency of markets.

(iii) Why is there asymmetric information in labor markets? What signals can employers look for when they are seeking in a new employee?

(iv) Describe how asymmetric information can affect principal-agent relationships.

06. Consider the following payoff matrix of the prisoner's dilemma type game (all values are in million of rupees.)

Player two

| Player one | | Cooperate | Cheat |
|---|---|---|---|
| | Cooperate | 10 10 | 0 12 |
| | Cheat | 12 0 | 5 5 |

(a) What is each player's dominant strategy? Explain the Nash equilibrium of the game. What is the Pareto optimum of this game?

(b) Two firms that are in a duopoly market planning to sell $Q_1$ or $Q_2$ of their goods and face the following payoff matrix (Payoffs are in millions of rupees.)

Firm 02

Firm 01

| | $Q_1$ | | $Q_2$ | |
|---|---|---|---|---|
| $Q_1$ | 30 | 30 | 50 | 35 |
| $Q_2$ | 40 | 40 | 20 | 30 |

(i) What is the Nash Equilibrium if both firms make their decisions simultaneously? What strategy does each firm use?

(ii) Suppose that firm one can decide first, What is the outcome?

(iii) Suppose that firm two can decide first, What is the outcome?

(c) Explain the difference between 'Nash equilibrium' and 'Pareto efficient competitive equilibrium' ?

# Faculty of Social Sciences - University of Kelaniya

## MA/MSSc Course - 2020

## Year End Examination (October – December 2021)

## Economics

## ECON 53015/ M 01 : Advanced Economic Theory Microeconomics

**Answer only Four (04) questions.**

**No. of Questions: 06** **Time : 03 hours**

---

01. (i) Utility function = $U(x,y) = x^{0.25}\ y^{0.75}$

Budget constraint = XPx + YPy = M

X and Y are two goods. Px is the price of X, Py is the price of Y and M is the consumer income. Derive following by using above data.

(a) Derive the Marshallian demand functions. (05 Marks)

(b) Derive the compensated demand functions using the results of (a) (10 Marks)

(c) Explain how decompose the total effect of price reduction of good X into income and substitution effect under Hickshian or Slutsky approach by using graphs. (05 Marks)

02. (i) Describe, why production function analysis is widely used than alternative approaches in analyzing the production processes. (04 Marks)

(ii) Explain returns to scale in the long-run production process and describe the reasons behind this different type of returns to scale. (07 Marks)

(iii) What do you mean by technological progress in production? Briefly explain, how it is affected on the level of output and input combination. (04 Marks)

03. (i) A multi -product firm must decide the optimum product combination but not the optimum factor combination." Discuss. (04 Marks)

(ii) Describe the equilibrium of a multi-product firm graphically or mathematically assuming that the firm products X and Y, using G amount of resources. (07 Marks)

(iii) Define the expansion path. How is it useful for producers? (04 Marks)

04. (i) Why do economists often disagree on welfare policies in an economy? Explain. (07 Marks)

(ii) Explain what are the major goals of social welfare policies in an economy. (08 Marks)

05. (i) Why might it be difficult for a buyer and seller to agree on a price when asymmetric information exists? Explain with examples

(ii) Explain moral hazard and how it can effect the efficiency of markets.

(iii) Why is there asymmetric information in labor markets? What signals can employers look for when they are seeking in a new employee?

(iv) Describe how asymmetric information can affect principal-agent relationships.

06. Consider the following payoff matrix of the prisoner's dilemma type game (all values are in million of rupees.)

Player two

| Player one | | Cooperate | | Cheat | |
|---|---|---|---|---|---|
| | Cooperate | 10 | 10 | 0 | 12 |
| | Cheat | 12 | 0 | 5 | 5 |

(a) What is each player's dominant strategy? Explain the Nash equilibrium of the game. What is the Pareto optimum of this game?

(b) Two firms that are in a duopoly market planning to sell $Q_1$ or $Q_2$ of their goods and face the following payoff matrix (Payoffs are in millions of rupees.)

Firm 02

Firm 01

| | $Q_1$ | | $Q_2$ | |
|---|---|---|---|---|
| $Q_1$ | 30 | 30 | 50 | 35 |
| $Q_2$ | 40 | 40 | 20 | 30 |

(i) What is the Nash Equilibrium if both firms make their decisions simultaneously? What strategy does each firm use?

(ii) Suppose that firm one can decide first, What is the outcome?

(iii) Suppose that firm two can decide first, What is the outcome?

(c) Explain the difference between 'Nash equilibrium' and 'Pareto efficient competitive equilibrium' ?

කැලණිය විශ්වවිද්‍යාලය - සමාජීය විද්‍යා පීඨය

ශාස්ත්‍රපති/සමාජීය විද්‍යාපති පාඨමාලාව - 2020

වාර්ෂික පරීක්ෂණය (2021 ඔක්තෝබර් - දෙසැම්බර්)

ආර්ථික විද්‍යාව

**ECON 53025/ ECON M 02 : උසස් ආර්ථික න්‍යාය - සාර්ව ආර්ථික විද්‍යාව**

**ප්‍රශ්න හතරකට (04) පමණක් පිළිතුරු සපයන්න.**

ප්‍රශ්න සංඛ්‍යාව: 06 යි. කාලය: පැය 03 යි.

---

01. ISLM විශ්ලේෂණය සේවා වියුක්තිය අඩු කිරීමට සහ ආර්ථිකය ප්‍රසාරණය කිරීමට ප්‍රායෝගිකව භාවිත කරන්නේ කෙසේද යන්න විමසන්න. (ලකුණු 15)

02. (අ) විවෘත ආර්ථිකයක වඩාත් වැදගත් ආර්ථික අරමුණු සහ එම අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා වූ ප්‍රතිපත්ති මෙවලම් පැහැදිලි කරන්න. (ලකුණු 04)

(ආ) ශ්‍රී ලංකාවේ කොවිඩ් 19 වසංගතය හේතුවෙන් ඇති වූ ආර්ථික පසුබෑමට ප්‍රතිචාර දැක්වීම සඳහා අනුගමනය කර ඇති විවිධ මූල්‍ය සහ රාජ්‍ය/ෆිස්කල් මෙවලම් හඳුනාගෙන කෙටියෙන් පැහැදිලි කරන්න. ආර්ථික ප්‍රතිසාධනයට ප්‍රතිචාර දැක්වීමේ දී මෙම ප්‍රතිපත්ති මෙවලම් කොතරම්දුරට කාර්යක්ෂම වේ ද යන්න ප්‍රස්තාරිකව නිරූපණය කරමින් විශ්ලේෂණය කරන්න. (ලකුණු 07)

(ඇ) පහත ප්‍රස්තාරයේ දැක්වෙන පරිදි ශ්‍රී ලංකාවේ ආර්ථිකය එහි පූර්ණ සේවා නියුක්ති මට්ටමට වඩා අඩු රුපියල් මිලියන 700 ක නිෂ්පාදන මට්ටමක් පවත්වාගෙන යන බව සහ ආන්තික පරිභෝජන නැඹියාව (MPC 0.8) ක් බව උපකල්පනය කරන්න. ආර්ථිකය පූර්ණ සේවා නියුක්ති මට්ටම කරා ගෙන ඒම සඳහා වියදම් ප්‍රමාණවත් ලෙස උත්තේජනය කිරීමට රජය අපේක්ෂා කරයි.

(i) AD නැවත පූර්ණ සේවා නියුක්තිය දක්වා වැඩි කිරීම සඳහා රජයේ වියදම් කොපමණ වැඩි කළ යුතු ද? (ලකුණු 02)

(ii) AD පූර්ණ සේවා නියුක්තිය දක්වා ඉහළ දැමීමට රජය කොපමණ බදු ප්‍රමාණයක් අඩු කළ යුතු ද? (ලකුණු 02)

03. ව්‍යාපාර චක්‍රයක (Business Cycle) අදියර කෙටියෙන් පැහැදිලි කර, කේන්සියානු සහ මූල්‍යවාදී (Keynesians and Monetarists) ප්‍රවේශයන් යොදාගනිමින් ව්‍යාපාර චක්‍රවල උච්චාවචනයන් ස්ථායීකරණය කිරීමෙහිලා පිස්කල් සහ මූල්‍ය ප්‍රතිපත්තිවල කාර්යභාරය විස්තර කරන්න. (ලකුණු 15)

04. වෙළෙඳපොළ පොලී අනුපාතිකය තීරණයවීමේදී ද්‍රවශීලතා වරණ න්‍යාය (Liquidity Presence Theory) සහ ණය අරමුදල් න්‍යාය (Loanable Funds Theory) අතර පවතින වෙනස්කම් සාකච්ඡා කරන්න. (ලකුණු 15)

05. තුලිත ආර්ථිකයක මූලික සාර්ව ආර්ථික අරමුණු මොනවාදැයි විස්තර කොට එහි දී ඇතැම් සාර්ව ආර්ථික අරමුණු අතර මතුවිය හැකි ගැටුම් මොනවාදැයි පැහැදිලි කරන්න. (ලකුණු 15)

06. එක්තරා කල්පිත අර්ථක්‍රමයක සාර්ව ආර්ථික දත්ත සමූහයක් පහත වගුව මගින් සාරාංශ කොට දක්වා ඇත. (සියලුම දත්ත ඒකක රුපියල් දශ ලක්ෂ වලින් වන අතර පොලී අනුපාතය ප්‍රතිශත වශයෙනි.)

| Y | C | r % | I | $L_1$ | $L_2$ | M |
|---|---|---|---|---|---|---|
| 2000 | 1800 | 10 | 500 | 500 | 500 | 1000 |
| 3000 | 2600 | 12 | 400 | 800 | 400 | 1000 |

ඉහත දී ඇති දත්ත භාවිතයෙන්,

(අ) IS-LM ශ්‍රිත ව්‍යුත්පන්න කර සමතුලිත පොලී අනුපාතය සහ සමතුලිත ජාතික ආදායම ගණනය කරන්න. (ලකුණු 05)

(ආ) IS-LM වක්‍රවල බෑවුම කෙරෙහි බලපාන සාධක සාකච්ඡා කරන්න. (ලකුණු 05)

(ඉ) තුලන අය-වැය ගුණකය යන්නෙන් අදහස් වන්නේ කුමක් ද? (ලකුණු 05)

# Faculty of Social Sciences - University of Kelaniya
## MA/MSSc Course - 2020
## Year End Examination (October – December 2021)

## Economics

## ECON 53025/ M 02 : Advanced Economic Theory Macroeconomics
**Answer only Four (04) questions.**

**No. of Questions: 06** **Time : 03 hours**

---

01. Examine how practically use IS-LM analysis for reducing unemployment and expanding the economies in the world. (15 Marks)

02. (a) Explain the most important economic objectives of an open economy and the policy instruments to achieve those objectives? (04 Marks)

(b) Identify and briefly explain different fiscal and monetary tools that have been adopted to response the economic slump which has resulted from the outbreak of the COVID – 19 pandemics in Sri Lanka. Graphically illustrate and analyze how effective these policy tools in responding the economic recovery? (07 Marks)

(c ) Suppose Sri Lankan economy is producing a level of output of 700 million rupees which is below its full employment level as shown by the graph below and assume the Marginal Propensity to Consume (MPC) equals 0.80. The government wishes to stimulate spending by enough to return the economy to full employment.

(i) How much would government spending have to increase by to increase AD back to full employment? (02 Marks)

(ii) How much would the government have to reduce taxes by to increase AD back to full employment? (02 Marks)

03. Explain the stage of the Business cycle in brief and describe the roles of fiscal and Monetary Policy in stabilizing the fluctuations of the Business cycles using Keynesians and Monetarists approaches. (15 Marks)

04. Discuss the differences between 'Liquidity Preference Theory' and ' Loanable Funds Theory of market interest rate determination. (15 Marks)

05. Describe what the key macroeconomic objectives in a balance economy and explain what are the possible conflicts that could arise between macroeconomic objectives.

(15 Marks)

06. The following table summarizes some macroeconomic data of a hypothetical economy (all figures are unit of millions of rupees and interest rate is percentages).

| Y | C | r% | I | $L_4$ | $L_3$ | M |
|---|---|---|---|---|---|---|
| 2000 | 1800 | 10 | 500 | 500 | 500 | 1000 |
| 3000 | 2600 | 12 | 400 | 800 | 400 | 1000 |

Using the above data

(a) Derive IS-LM curves and compute the equilibrium interest rate and the equilibrium level of national income. (05 Marks)

(b) Discuss the factors affect on the slopes of the IS-LM curves (05 Marks)

(c) What is meant by 'Balanced budget multiplier? (05 Marks)

කැලණිය විශ්වවිද්‍යාලය - සමාජීය විද්‍යා පීඨය
ශාස්ත්‍රපති/සමාජීය විද්‍යාපති පාඨමාලාව - 2020
වාර්ෂික පරීක්ෂණය (2021 ඔක්තෝබර් - දෙසැම්බර්)

ආර්ථික විද්‍යාව

ECON 53035/ ECON M 03 : ආර්ථික විද්‍යාව සඳහා ගණිතය සහ සංඛ්‍යානය

**එක් කොටසකින් ප්‍රශ්න දෙක (02) බැගින් ප්‍රශ්න හතරකට (04) පිළිතුරු සපයන්න.**

ප්‍රශ්න සංඛ්‍යාව: 06 යි. කාලය: පැය 03 යි.

---

## I කොටස

01. (අ) එක්තරා ආයතනයක් A භාණ්ඩයෙන් x ඒකක ප්‍රමාණයක් ද B භාණ්ඩයෙන් y ඒකක ප්‍රමාණයක් ද නිෂ්පාදනය කර අලෙවි කරයි.
ආයතනයේ අයභාර ශ්‍රිතය $R(x,y) = 80x + 100y$ මගින් ද
පිරිවැය ශ්‍රිතය $C(x,y) = x^2 + 1.5y^2 - xy + 150$ මගින් ද දෙනු ලැබේ. අලෙවිය පිළිවෙලින් ඒකක 50 සහ 25 දී ආයතනයේ ආන්තික ලාභ සොයා එය අර්ථ දක්වන්න.

(ලකුණු 05)

(ආ) ආයතනයක ඉල්ලුම් ශ්‍රිතය $Q - 90 + 2P = 0$ ද
සාමාන්‍ය පිරිවැය ශ්‍රිතය $AC = Q^2 - 8Q + 57 + \frac{2}{Q}$ ද වේ.

(i) මුළු අයභාර උපරිම වන

(ii) ආන්තික පිරිවැය අවම වන සහ

(iii) ලාභ උපරිම වන නිමැවුම සොයන්න. (ලකුණු 06)

(ඇ) නිමැවුම් මට්ටම ඒකක q වන විට එක්තරා කර්මාන්ත ශාලාවක ආන්තික පිරිවැය ඒකකයකට ඩොලර් $6(q-5)^2$ වේ. නිමැවුම් මට්ටම ඒකක 10 සිට 13 දක්වා වැඩි වන විට මුළු නිෂ්පාදන පිරිවැය කොපමණ ප්‍රමාණයකින් වැඩි වේ ද? (ලකුණු 04)

02. (අ) සීනි කිලෝ ග්‍රෑම් 2ක් හා තේ කොළ කිලෝ ග්‍රෑම් 1ක් සඳහා වියදම රු.700කි. සීනි කිලෝ ග්‍රෑම් 1 ක් සහ කිරිපිටි කිලෝ ග්‍රෑම් 1ක් සඳහා වියදම රු.700කි. සීනි කිලෝ ග්‍රෑම් 3ක්, තේ කොළ කිලෝ ග්‍රෑම් 2ක් සහ කිරිපිටි කිලෝ ග්‍රෑම් 1ක් සඳහා වියදම රු.1700 කි. එක් එක් අයිතමයේ කිලෝ ග්‍රෑම් 1ක් සඳහා වන වියදම (මිල) න්‍යාස ප්‍රතිලෝම ක්‍රමය භාවිතයෙන් සොයන්න. (ලකුණු 10)

(ආ) ඒකක මිල ඩොලර $P = D(q) = -0.1q^2 + 90$ වන විට තොග ගැනුම්කරුවන් ටයර q ප්‍රමාණයක් මිලට (ඉල්ලුම් කරන්නේ යැයි) ගනී යැයි ටයර නිෂ්පාදකයකු ඇස්තමේන්තු කර ඇත. ටයරයක මිල ඩොලර $P = S(q) = 0.2q^2 + q + 50$ වන විට එම ප්‍රමාණයම (q) සපයනු ලබයි.

සමතුලිත මිලේදී පරිභෝජක අතිරික්තය සහ නිෂ්පාදක අතිරික්තය අනුකලනය භාවිතයෙන් නිශ්චය කරන්න. (ලකුණු 05)

03. (අ) යෝග්‍ය උදාහරණ දෙමින් සංරෝධක සහිත ප්‍රශස්තකරණය ආර්ථික විද්‍යාව තුළ භාවිතා කරන්නේ කෙසේදැයි පැහැදිලි කරන්න. (ලකුණු 05)

(ආ) පාරිභෝගිකයෙකුගේ උපයෝගීතා ශ්‍රිතය $U = (x,y) = x^a y^b$ මගින් දී ඇත. x භාණ්ඩයේ හා y භාණ්ඩයේ මිල ගණන් පිළිවෙලින් $P_x$ සහ $P_y$ ලෙස වේ. පාරිභෝගිකයාගේ ආදායම I මගින් දී ඇත. උපයෝගීතාව උපරිමවීමේදී x සහ y සඳහා වන ඉල්ලුම් ශ්‍රිත

$X = \frac{a}{(a+b)} \frac{I}{P_x}$ සහ $Y = \left[\frac{b}{a+b}\right] \frac{I}{P_y}$ බව පෙන්වන්න. (ලකුණු 10)

## II කොටස

04. (i) සොරකම් කරන ලද සමස්ත ත්‍රිරෝද රථවලින් 33% ක ප්‍රමාණයක් සොයාගෙන අයිතිකරුවන් වෙත ආපසු ලබාදෙනු ඇතැයි විශ්වාස කෙරේ. ඒ අනුව එක්තරා මාසයක දී ත්‍රිරෝද රථ 300ක් සොරකම් කර ඇත්නම් ඉන් ත්‍රිරෝද රථ 88ත් 110ත් අතර ප්‍රමාණයක් සොයාගෙන අයිතිකරුවන් වෙත ආපසු ලබාදීමට හැකිවීමේ සම්භාවිතාව කොපමණ ද?

(ලකුණු 03)

(ii) එක්තරා මංසන්ධියකට වාහන පැමිණීම අතර කාල පරාසයෙහි මධ්‍යනාය තත්පර 12ක් වන ඝාතීය සම්භාවිතා ව්‍යාප්තියක පිහිටයි. ඒ අනුව,

(අ) වාහන පැමිණීම අතර කාල පරාසය තත්පර 6ක් හෝ ඊට අඩුවීමේ සම්භාවිතාව කුමක් ද? (ලකුණු 02)

(ආ) වාහන පැමිණීම අතර කාල පරාසය තත්පර 30ක් හෝ ඊට වැඩිවීමේ සම්භාවිතාව කුමක් ද? (ලකුණු 02)

(ඇ) ඉහත තොරතුරු භාවිතයෙන් E ( 3x+2) සහ V (2x - 15) ගණනය කරන්න.

(ලකුණු 02)

(iii) $A_1$ සහ $A_2$ යන සිද්ධීන්ගේ පූර්ව සම්භාවිතාව $P(A_1) = 0.40$ සහ $P(A_2) = 0.60$ වේ. එසේම $P(A_1 \cap A_2) = 0$ වන අතර $P(B/A_1) = 0.20$ සහ $P(B/A_2) = 0.05$ වේ. ඒ අනුව,

(අ) $A_1$ සහ $A_2$ යන සිද්ධීන් අන්‍යෝන්‍ය වශයෙන් බහිෂ්කාරක ද? විග්‍රහ කරන්න. (ලකුණු 01)

(ආ) $P(A_1 \cap B)$ සහ $P(A_2 \cap B)$ ගණනය කරන්න. (ලකුණු 02)

(ඇ) P (B) ගණනය කරන්න. (ලකුණු 01)

(ඈ) බේයස් ප්‍රමේයය භාවිතයෙන් $P(A_1/B)$ සහ $P(A_2/B)$ ගණනය කරන්න. (ලකුණු 02)

05. (i) මහාචාර්යවරයෙක් විසින් ඉගැන්වීමේ ක්‍රම පිළිබඳ නව වැඩසටහනක් යොදා ගැනීමේ භව්‍යතාව ඇගයීම සඳහා දරන ලද උත්සාහයකදී සිසුන් දස දෙනෙකුගෙන් යුත් සසම්භාවී නියැදියක් පිරික්සුම් කාල පරිච්ඡේදයක් සඳහා තෝරා ගෙන ඇත. මෙම වැඩසටහන ඉදිරිපත් කිරීමට පෙර සහ පසු යම් විෂයයක් සඳහා සිසුවෙක් ලබාගත් ලකුණු පහත පරිදි වේ.

| ශිෂ්‍යයා | පෙර ලකුණු | පසු ලකුණු | ශිෂ්‍යයා | පෙර ලකුණු | පසු ලකුණු |
|---|---|---|---|---|---|
| 1 | 62 | 70 | 6 | 43 | 48 |
| 2 | 40 | 45 | 7 | 40 | 45 |
| 3 | 57 | 50 | 8 | 52 | 47 |
| 4 | 70 | 65 | 9 | 38 | 40 |
| 5 | 64 | 72 | 10 | 59 | 55 |

වැඩ සටහන ඉදිරිපත් කිරීමට පෙර සහ පසු සිසුන්ගේ තරාවන් අතර විශ්වාසනීය වූ වෙනසක් පවතී ද? (ලකුණු 04)

(ii) කිසියම් රටක පුද්ගල වැයකල හැකි ආදායම (X) සහ සමාහාර පරිභෝජනය (Y) පිළිබඳ දත්ත පහත වගුවෙන් ඉදිරිපත් කරයි.

| වසර | පරිභෝජන වියදම (ඩොලර බිලියන) | පුද්ගල වැයකළ හැකි ආදායම (ඩොලර බිලියන) |
|---|---|---|
| 2010 | 23 | 25 |
| 2011 | 25 | 27 |
| 2012 | 26 | 29 |
| 2013 | 28 | 31 |
| 2014 | 29 | 33 |
| 2015 | 31 | 37 |
| 2016 | 34 | 39 |

(අ) පුද්ගල වැයකළ හැකි ආදායම මත පරිභෝජනය සඳහා වන ප්‍රතිපායන රේඛාව ඇස්තමේන්තු කර ප්‍රතිඵලය විවරණය කරන්න. (ලකුණු 06)

(ආ) 5%ක වෙසෙසියා මට්ටමේදී පුද්ගල වැයකළ හැකි ආදායම් සංගුණකයේ විශ්වාසනීයත්වය පරීක්ෂා කරන්න. (ලකුණු 02)

(ඇ) නිර්ණන සංගුණකය ගණනය කර එම අගය විවරණය කරන්න. (ලකුණු 02)

(ඈ) ආදායමට අදාළ නියැදි මධ්‍යනායේ දී පරිභෝජන වියදම පුරෝකතනය කරන්න.

(ලකුණු 01)

06. (අ) ' විෂමප්‍රවිචලතාව ' සහ ' බහුඒකරේඛීයතාව ' විස්තර කරන්න. (ලකුණු 02)

(ආ) "රටක සෘජු විදේශීය ආයෝජන ප්‍රමාණය (INV) එම රටෙහි දළ ජාතික නිෂ්පාදිතයේ ප්‍රමාණයට (GNP) සහ වෙළෙඳ ශේෂයට (BAL) ධනාත්මක සම්බන්ධතාවක් දක්වන නමුත් දේශපාලනික අවදානම් මට්ටමට (POL) ඍණාත්මක සම්බන්ධතාවක් දක්වයි" යන විවාදාත්මක අදහසක් පවතී.

රටවල් 24කින් දත්ත ලබාගෙන ඇති අතර INV ඩොලර මිලියනවලින්ද, GNP ඩොලර බිලියනවලින්ද, BAL ඩොලර මිලියනවලින්ද දක්වෙන අතර POL යනු 0 සිට 10 දක්වා අගයක පිහිටි ඉහළ අගයක් මගින් ඉහළ දේශපාලනික අවදානමක් නිරූපණය වන පරිදි වූ දර්ශකයකි. ලබාගත් දත්තවලට අදාළ ප්‍රතිපායන ප්‍රතිඵල පහත දක්වේ.

$$INV = 289.68 + 0.859\ GNP + 0.714\ BAL - 33.0\ POL$$

$$Se \quad = (25.04) \quad (0.05725) \quad (0.1000) \quad (3.978)$$

$$R^2 = 96.6$$

(i) සංගුණක සියල්ලම විවරණය කරන්න. (ලකුණු 02)

(ii) එක් එක් විචල්‍යය ගත්විට, 1% ක වෙසෙසියා මට්ටමේදී ඒවා ඍජු විදේශීය අයෝජන සඳහා වෙසෙසි බලපෑමක් ඇති කරනවා ද? (ලකුණු 02)

(iii) ගැලපූ බහු නිර්ණන සංගුණකය (Adjusted multiple coefficient of determination) ගණනය කර විවරණය කරන්න. (ලකුණු 03)

(iv) පුරෝකතන විශ්‍රම්භ ප්‍රාන්තර තුළ නිර්මාණය විය යුත්තේ ඇයි දැයි පහදා මෙම ප්‍රාන්තරවල තරම සඳහා බලපාන සාධක පිළිබඳ විමසන්න. (ලකුණු 02)

(v) යම් රටක GNP ඩොලර බිලියන 200ක් ද, වෙළඳ ශේෂ හිගය ඩොලර මිලියන 100ක් ද සහ දේශපාලනික අවදානම් මට්ටම් දර්ශකය 5ක් ද නම් ඍජු විදේශීය ආයෝජන ප්‍රමාණයෙහි ලක්ෂ්‍යමය ඇස්තමේන්තුව ලබාගන්න. (ලකුණු 01)

(ඇ) පහත සඳහන් අරේඛීය ප්‍රතිපායන ආකෘතිය (Nonlinear regression model) සලකන්න.

$$Y_i = \beta_0 X_{1_i}^{\beta_1} X_{2_i}^{\beta_2} \varepsilon_1$$

(i) මෙම අරේඛීය ආකෘතිය රේඛීය ආකෘතියක් බවට පරිණාමය කරන්න. (ලකුණු 01)

(ii) පරිණාමය කළ ආකෘතිය අඩුතම වර්ග ක්‍රමය භාවිතයෙන් ඇස්තමේන්තු කර ඇත්නම් ඇස්තමේන්තු කළ පරාමිති වන $\beta_1$ සහ $\beta_2$ විවරණය කරන්නේ කෙසේ ද? (ලකුණු 02)

# Faculty of Social Sciences - University of Kelaniya

## MA/MSSc Course - 2020

## Year End Examination (October – December 2021)

## Economics

## ECON 53035/ M 03 : Mathematics and Statistics for Economics

**Answer Four (04) questions by selecting two (02) from each part.**

**No. of Questions: 07** **Time : 03 hours**

**Part I**

01. (i) A certain firm produces and sells x units of product A any y units of product B. Its revenue function is given by $R(x,y) = 80x + 100y$ and its cost function is given by $C(x,y) = x^2 + 1.5y^2 - xy + 150$. Find the marginal profits at (50,25) and interpret the result. (05 Marks)

(ii) Given a firm's demand function $Q - 90 + 2P = 0$ and its average cost function, $AC = Q^2 - 8Q + 57 + \frac{2}{Q}$, find the level of output which,

(a) maximizes total revenue
(b) minimized marginal cost, and
(c) maximizes profit (06 Marks)

(iii) At a certain factory , the marginal cost is $6(q-5)^2$ dollars per unit when the level of production is q units By how much will the total manufacturing cost increase if the level of production is raised from 10 to 13 units? (04 Marks)

02. (i) The cost of 2kg of Sugar and 1kg of Tea is Rs.700. The cost of 1kg of Sugar and 1kg of Milk powder is Rs.700. The cost of 3kg of Sugar and 2kg of Tea and 1kg of Milk Powder is Rs.1700. Find the cost of 1kg of each item using matrix inversion method. (10 Marks)

(ii) A tire manufacturer estimates that q (thousand) radial tires will be purchased (demanded) by wholesalers when the price is $P = D(q) = -0.1q^2 + 90$ dollars per tire, and the same number of tires will be supplied when the price is $P = S(q) = 0.2q^2 + q + 50$ dollars per tire.
Determine the consumers ' and producers' surplus at the equilibrium price using the technique of integration. (05 Marks)

03. (i) Giving suitable examples, briefly explain the technique of constrained optimization used in economics. (05 Marks)

(ii) A consumer utility function is given by $U = (x,y) = x^a y^b$. Prices of good x and y are $p_x$ and $p_y$ respectively. The income of the consumer is given by I. Show the utility maximizing demand quantitatively x and y are given by

$$X = \frac{a}{(a+b)} \frac{I}{P_x} \quad \text{සහ} \quad Y = \left[\frac{b}{a+b}\right] \frac{I}{P_y}$$ (10 Marks)

## Part II

04. (i) It is believed that 33% of all stolen three-wheelers are recovered and returned to the owners. In a month when 300 three-wheelers are stolen, what is the probability that between 88 and 110 three-wheelers will be recovered and returned to their owners. (03 Marks)

(ii) The time between arrivals of vehicles at a particular intersection follows an exponential probability distribution with a mean of 12 seconds.

(a) What is the probability that the arrival time between vehicles is 6 seconds or less? (02 Marks)

(b) What is the probability of 30 or more seconds between vehicle arrivals? (02 Marks)

(c) Using above information compute the $E(3x + 2)$ and $V(2x - 15)$. (02 Marks)

(iii) The prior probabilities for events $A_1$ and $A_2$ are $P(A_1) = 0.40$ and $P(A_2) = 0.60$. It is also known that $P(A_1 \cap A_2) = 0$. Suppose $P(B/A_1) = 0.20$ and $P(B/A_2) = 0.05$.

(a) Are $A_2$ and $A_2$ mutually exclusive? Explain. (01 Mark)

(b) Compute $P(A_1 \cap B)$ and $P(A_2 \cap B)$ (02 Marks)

(c) Compute $P(B)$ (01 Mark)

(b) Apply Bayes' theorem to compute $P(A_1/B)$ and $P(A_2/B)$ (02 Marks)

05. (i) A professor attempts to evaluate the potential for a new teaching scheme by selecting a random sample of ten students to use the new teaching scheme for a trial period. The scores for a particular subject before and after implementing the new teaching scheme are shown below.

| Student | Score before | Score after | Student | Score before | Score after |
|---|---|---|---|---|---|
| 1 | 62 | 70 | 6 | 43 | 48 |
| 2 | 40 | 45 | 7 | 40 | 45 |
| 3 | 57 | 50 | 8 | 52 | 47 |
| 4 | 70 | 65 | 9 | 38 | 40 |
| 5 | 64 | 72 | 10 | 59 | 55 |

Are the rankings of the individual students significantly different between the two schemes (before and after) ? (04 Marks)

(ii) Following table gives data on personal disposable income (X) and aggregate consumption expenditure (Y) in a country.

| **Year** | **Consumption expenditure ($ billions)** | **Personal disposable income ($ billions)** |
|---|---|---|
| 2010 | 23 | 25 |
| 2011 | 25 | 27 |
| 2012 | 26 | 29 |
| 2013 | 28 | 31 |
| 2014 | 29 | 33 |
| 2015 | 31 | 37 |
| 2016 | 34 | 39 |

(a) Estimate the regression line of consumption expenditure on personal disposable income, and interpret the results. (06 Marks)

(b) Test the significance of the coefficient of personal disposable income at 5% level of significance. (02 Marks)

(c) Compute the coefficient of determination and interpret it. (01 Mark)

(d) Forecast the consumption at the mean income of the sample. (02 Marks)

06. (i) Explain "Heteroscedasticity' and ' Multicollinearity'. (02 Marks)

(ii) It is argued that the amount of direct foreign investment (INV) in a country is positively related to the size of its gross national product (GNP) and its trade balance (BAL) but inversely related to its level of political risk (POL). Data were collected for 24 countries. INV is measured in \$ million, GNP in \$ billion and BAL in \$ million and POL is an index which runs from 0 to 10 where the higher the number the greater the level of political risk.
The appropriate regression results are given below.

$$INV = 289.68 + 0.859\, GNP + 0.714\, BAL - 33.0\, POL$$

$$Se = (25.04) \quad (0.05725) \quad (0.1000) \quad (3.978) \qquad R^2 = 96.6$$

(a) Interpret all coefficients. (02 Marks)

(b) Taken individually, do the variables have a significant influence on direct foreign investment at the 1 per cent level of significance? (02 Marks)

(c) Compute adjusted multiple coefficient of determination and interpret it. (03 Marks)

(d) Explain why predictions should be made within confidence limits and discuss the factors that would affect the size of these limits. (02 Marks)

(e) Give the point prediction for a direct foreign investment for a country that has a GNP of $ 200 billion, a balance of payment current account deficit of $ 100 million and political risk factor of 5. (01 Mark)

(iii) Consider the following nonlinear regression model.

$$Y_i = \beta_0 X_{1_i}^{\beta_1} X_{2_i}^{\beta_2} \varepsilon_1$$

(a) Transform this nonlinear model into the linear model. (01 Mark)

(b) If the transformed model is estimated by ordinary least squares method, how do you interpret the estimated parameters of $\beta_1$ and $\beta_2$ ? (02 Marks)

# Faculty of Social Sciences - University of Kelaniya
## MA/MSSc Course - 2020
## Year End Examination (October – December 2021)

### Economics

### ECON 53045/ M 04 : Economic Though, Growth and in Sri Lanka 's Economic Development

**Answer only Four (04) questions.**

**No. of Questions: 06** **Time : 03 hours**

01. Paradigm shift arises when the dominant paradigm with which normal science operates is rendered incompatible with new phenomena. Can Keynesian theory be described as a paradigm shift in history of economic thought? Give reasons to your answer.

(15 Marks)

02. "The true barrier to capitalist production is capital itself." Explain and comment.

(15 Marks)

03. What are the main elements of the Washington Consensus? Do you agree with the view that Sri Lanka followed its main elements even before they were formulated? Explain your answer. (15 Marks)

04. What are the main arguments of Modern Monetary Theory (MMT) ? Do you agree with the view that the recent decisions taken by the Central Bank of Sri Lanka are guided by the MMT? Give reasons to your answer. (15 Marks)

05. Explain the practical usage of Buddhist economic thought in Asian Countries with examples (15 Marks)

06. Explain the recent trends of population and discuss its economic impact on Sri Lankan economy. (15 Marks)

කැලණිය විශ්වවිද්‍යාලය - සමාජීය විද්‍යා පීඨය

ශාස්ත්‍රපති/සමාජීය විද්‍යාපති පාඨමාලාව - 2020

වාර්ෂික පරීක්ෂණය (2021 ඔක්තෝබර් - දෙසැම්බර්)

ආර්ථික විද්‍යාව

**ECON 53045/ ECON M 04 : ආර්ථික චින්තනය, වර්ධනය සහ ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය**

**ප්‍රශ්න හතරකට (04) පමණක් පිළිතුරු සපයන්න.**

ප්‍රශ්න සංඛ්‍යාව: 06 යි. කාලය: පැය 03 යි.

---

01. විද්‍යාව ක්‍රියාත්මක වන සාමාන්‍ය කාලයන්හි ආධිපත්‍ය සුසමාදර්ශය, නව සංසිද්ධීන් සමඟ සුසංගත සහ අනුකූල වූ විට සුසමාදර්ශ විතැන්වීමක් සිදුවේ. කේන්සියානු න්‍යාය ආර්ථික චින්තන ඉතිහාසයෙහි එවන් සුසමාදර්ශ විතැන්වීමක් වශයෙන් විස්තර කළ හැකි ද? ඔබේ පිළිතුරට හේතු දක්වන්න. (ලකුණු 15)

02. "ධනේශ්වර නිෂ්පාදනයට ඇති සැබෑ බාධකය ප්‍රාග්ධනයමය" මෙම ප්‍රකාශය පැහැදිලි කර අදහස් දක්වන්න. (ලකුණු 15)

03. වොෂින්ටන් සම්මුතයේ මූලිකාංග කවරේ ද? එහි මූලික අදහස් සූත්‍රගත කිරීමටත් පෙර ශ්‍රී ලංකාවේ ඒ මූලික අංග අනුගමනය කළේය. ඔබේ පිළිතුර පැහැදිලි කරන්න. (ලකුණු 15)

04. නූතන මූල්‍ය න්‍යායේ ප්‍රධාන තර්ක කවරේ ද? ශ්‍රී ලංකා මහ බැංකුව මෑතකදී ගත් තීරණ නූතන මූල්‍ය න්‍යාය මගින් මෙහෙයනු ලැබීය යන අදහස සමඟ ඔබ එකඟ වන්නේ ද? ඔබේ පිළිතුරට හේතු දක්වන්න. (ලකුණු 15)

05. බෞද්ධ ආර්ථික චින්තනයේ ප්‍රායෝගික භාවිතය ආසියානු රටවල අත්දැකීම් ආශ්‍රයෙන් පැහැදිලි කරන්න. (ලකුණු 15)

06. ශ්‍රී ලංකාවේ ජනගහනයේ මෑතකාලීන උපනතීන් පැහැදිලි කර, එහි ආර්ථික බලපෑම් සාකච්ඡා කරන්න. (ලකුණු 15)

කැලණිය විශ්වවිද්‍යාලය - සමාජීය විද්‍යා පීඨය
ශාස්ත්‍රපති/සමාජීය විද්‍යාපති පාඨමාලාව - 2020
වාර්ෂික පරීක්ෂණය (2021 ඔක්තෝබර් - දෙසැම්බර්)

ආර්ථික විද්‍යාව

ECON 53055 : මූල්‍ය ආර්ථික විද්‍යාව සහ රාජ්‍ය මූල්‍ය

**ප්‍රශ්න හතරකට (04) පමණක් පිළිතුරු සපයන්න.**

ප්‍රශ්න සංඛ්‍යාව: 06 යි. කාලය: පැය 03 යි.

---

01. (අ) කෙන්සියානු ද්‍රවශීලතා වරණ න්‍යාය පාදක කර ගනිමින් පුද්ගලයකුගේ ද්‍රවශීලතා වරණය සඳහා බලපාන සාධක පැහැදිලි කොට විමසන්න.

(ආ) සුදුසු ප්‍රස්තාර සටහන් භාවිතා කරමින් ද්‍රවශීලතා පාශය යන්න පැහැදිලි කොට ද්‍රවශීලතා පාශයක් පවතින අවස්ථාවේදී මුදල් ප්‍රතිපත්තිය අකර්මන්‍ය වන්නේ කෙසේ ද යන්න විමසන්න.

02. අදාළ න්‍යායන් භාවිතා කරගනිමින් මූල්‍ය අතරමැදිකරණයේ සහ පොලී අනුපාත නිදහස්කරණයේ වාසි අවාසි සාකච්ඡා කරන්න.

03. (අ) මුදල් ඉල්ලුම පිළිබඳව පවතින පශ්චාත් කෙන්සියානු න්‍යායන් සංසන්දනය කරමින් ඒවායෙහි ශක්තීන් සහ දුර්වලතා සාකච්ඡා කරන්න.

(ආ) මුදලට ඇති සමාපේක්ෂණ ඉල්ලුම පිළිබඳ ටෝබින්ගේ විග්‍රහය පැහැදිලි කර, බැඳුම්කර වලින් වඩා ප්‍රතිලාභයක් ලැබුණ ද මිනිසුන් මුදල් සහ බැඳුම්කර යන දෙවර්ගයම ළඟ තබා ගැනීමට කැමැත්තක් දක්වන්නේ ඇයි ද යන්න විචාරාත්මකව සාකච්ඡා කරන්න.

04. සාර්ව ආර්ථික අරමුණු ඉටුකරගැනීම උදෙසා රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය මෙහෙයවිය හැකි ආකාරය පිළිබඳව සාකච්ඡා කරන්න.

05. ආර්ථික ලිබරල්කරණයෙන් අනතුරුවම ශ්‍රී ලංකාවේ තීරු බදු ප්‍රතිසංස්කරණ හා සැලසුම් පිළිබඳව පැහැදිලි කරන්න.

06. ශ්‍රී ලංකාවේ රාජ්‍ය ණය හා විදේශීය ආයෝජනයන්හි මෑතකාලීන හැසිරීම උදෙසා කොවිඩ් - 19 (COVID - 19) වසංගතයෙන් සිදු වූ බලපෑම පිළිබඳව විශ්ලේෂණය කරන්න.

# Faculty of Social Sciences - University of Kelaniya
## MA/MSSc Course - 2020
## Year End Examination (October – December 2021)

## Economics

## ECON 53055 : Monetary Economics and Public Finance

**Answer only Four (04) questions.**

**No. of Questions: 06** **Time : 03 hours**

01. (a) Discuss the factors influence on the liquidity preference of individual based on the Keynesian liquidity preference theory.

    (b) Utilizing suitable diagrams explain the liquidity trap ' situation and discuss how monetary policy is ineffective when liquidity trap exists.

02. Critically analyze the effect of financial intermediation and interest rate liberalization based on the related theories.

03. (a) Compare and contrast post Keynesian theories of money demand and critically discuss their strengths and weaknesses.

    (b) Explain Tobin's model on speculative demand for money and discuss why do people desire keep money and bonds in Hand even though bond holding gives a better yield.

04. Discuss how fiscal policy can be directed towards achieving macroeconomic objectives.

05. Explain the tariff reforms and planning after the liberalized economy in Sri Lanka.

06. Analyze the impact of the COVID - 19 pandemic on the recent behavior of public debt and foreign investment in Sri Lanka.

කැලණිය විශ්වවිද්‍යාලය - සමාජීය විද්‍යා පීඨය
ශාස්ත්‍රපති/සමාජීය විද්‍යාපති පාඨමාලාව - 2020
වාර්ෂික පරීක්ෂණය (2021 ඔක්තෝබර් - දෙසැම්බර්)

ආර්ථික විද්‍යාව

ECON 53065 /M 5.03 : **ව්‍යාපෘති විශ්ලේෂණය සහ කළමනාකරණය**

**ප්‍රශ්න හතරකට (04) පමණක් පිළිතුරු සපයන්න.**

